
# 11 ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්යයන්




11.1 - ජේසුස් වහන්සේ කළ ප්‍රාතිහාර්ය

ප්‍රාතිහාර්ය යනු ස්වභාව ධර්මය තුළ සාමාන්‍යයෙන් සිදු නොවන පුදුම ක්‍රියා ය.

**ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ග හතරකි.**

1. ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය
   උදා:- මාරුත දමනය

2. රෝගීන් සුව කිරීම
   උදා:- කුදු ස්ත්‍රිය සබත් දිනයේ දී සුව කිරීම



3. දුෂ්ටාත්මයන් දුරු කිරීම
   උදා:- ගෙරසේනයේ දුෂ්ටාත්මාවේශ වූවකු සුව කිරීම

4. මළවුන් උත්ථානය කිරීම
   උදා:- ජායිරස්ගේ දුව උත්ථාන කිරීම



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

## 1. ස්වභාව ධර්මය හා සම්බන්ධ ප්‍රාතිහාර්ය - මාරුත දමනය

එක් දිනක් ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන් සමග ඔරුවකට නැගී, "අපි එගොඩට යමු"යි ඔවුන්ට වදාළ සේක. එවිට ඔවුහු ඔරුව දියත් කළහ. ඔවුන් යාත්‍රා කරද්දී උන්වහන්සේ නිදා ගත් සේක. එකල චණ්ඩ මාරුතයක් නැගී විල මත හැමී ය; ඔරුවට වතුර පිරෙත් ම ඔවුහු මහ අනතුරකට පත් ව සිටියහ. ඔවුහු අවුත් උන්වහන්සේ පුබුදුවා, "ස්වාමීනි, ස්වාමීනි, අප විනාශ වෙන්න ළඟ ය"යි කීහ. උන්වහන්සේ පිබිද, මාරුතයට ද රළු තරංගවලට ද තර්ජනය කළ සේක. එවිට මාරුතය සංසිඳී නිශ්චලත්වයක් ඇති විය. "ඔබේ ඇදහිල්ල කොයි දැ"යි උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක. ඔවුහු බිය ව, විස්මයට පත් වී, "මේ මොන විදියේ කෙනෙක් ද? සුළඟට හා ජලයට පවා මෙතුමාණෝ අණ දෙති, ඒවා ද කීකරු වන්නේ ය"යි එකිනෙකාට කියා ගත්හ.

(ලූක් 8:22-25)

මාරුත දමනයේ ප්‍රාතිහාර්යයෙන් අපට පෙන්වන්නේ

- ★ ජේසුස් වහන්සේ සැබෑ දේව පුත්‍රයාණන් බවත්
- ★ ස්වභාව ධර්මය පවා උන්වහන්සේට කීකරු වන බවත් ය

එම නිසා අප ද ජේසුස් වහන්සේ විශ්වාස කළ යුතු අතර උන්වහන්සේගේ අණට කීකරු විය යුතු ය. දේව වචනයට එකඟ ව නිතර ම නිවැරදි දෙය පමණක් කිරීමට උත්සාහ කළ යුතු ය. අපගේ විශ්වාසය හීන වී ගෙන යන අවස්ථාවල දී නිරතුරු යාච්ඤා කිරීමෙන් නැවත විශ්වාසය ගොඩනගා ගැනීමට අප උත්සාහ කළ යුතු ය.

## 2. රෝගීන් සුව කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය - සබත් දින කුදු ස්ත්‍රිය සුව කිරීම

උන්වහන්සේ සබත් දිනක එක් ධර්ම ශාලාවක අනුශාසනා කරමින් සිටි සේක. එහි දසඅට වසක් තිස්සේ අශුද්ධාත්මයක් නිසා දුර්වලකමින් පෙළුණු, කොයි අන්දමකින්වත් කෙළින් වෙන්නට බැරි ස්ත්‍රියක් වූවා ය. ජේසුස් වහන්සේ ඇ දැක කැඳවා, "ස්ත්‍රිය, ඔබේ දුර්වලකමින් ඔබ මිදුණෙහි ය"යි කියා ඇ පිට අත් තැබූ සේක. එකෙණෙහි ම ඇ කෙළින් සිට, දෙවියන් වහන්සේට ප්‍රශංසා කළා ය.

(ලූක් 13:10-13)

මෙම ප්‍රාතිහාර්ය මගින් පෙන්නුම් කරන්නේ ජේසුස් වහන්සේ ඒ ස්ත්‍රියගේ වේදනාව දැක පිහිට වූ ආකාරය යි. අප ද අන් අයගේ දුක වේදනාව හමුවේ දෑස් පියා ගෙන නොසිට ඒ අයට පිහිට විය යුතු ය. ඇයගේ කිසි ම ඉල්ලීමක් නොමැති ඇයට ජේසුස් වහන්සේ දයාව දැක්වූ සේක.

අප නිතර ම රෝගීන් සඳහා යාච්ඤා කළ යුතු ය. ශාරීරික හා මානසික රෝගවලින් පෙළෙන ජනතාව වෙනුවෙන් අපගේ නිරන්තර යාච්ඤාව යොමු කළ යුතු ය. ඔවුන්ගේ එම රෝගී තත්ත්වයන් ඉක්මනින් සුවපත් කරන ලෙස අයැදිය යුතු ය.

**3. දුෂ්ටාත්මයන් දුරු කිරීම සම්බන්ධ ප්‍රාතිහාර්ය - ගෙරසේනයේ දුෂ්ටාත්මාවේශ වූවෙකු සුව කිරීම**

ඔවුහු ගලීලය ඉදිරියෙහි වූ ගෙරසේනයන්ගේ රටට පැමිණියහ. උන්වහන්සේ ගොඩ බසිත් ම, නුවරින් ආ දුෂ්ටාත්මාවේශ වූ මිනිසෙක් උන්වහන්සේට හමු විය. ඔහු බොහෝ කලක් ම නිර්වස්ත්‍ර ව, ගෙයක නොව, සොහොන් ගෙවල වාසය කළේ ය. ඔහු ජේසුස් වහන්සේ දැක, මොරගසා, උන්වහන්සේ ඉදිරියෙහි වැඳ වැටී "පරමෝත්තම දෙවියන්ගේ පුත්‍ර වූ ජේසුස් වහන්ස, ඔබත්, මාත් අතර මොන ගනුදෙනුවක් ද? මට වද නොදෙන මෙන් අයදිමි"යි මහ හඬින් කීවේ ය. මෙසේ කීවේ, ඒ මිනිසාගෙන් දුරුවන්න උන්වහන්සේ අශුද්ධාත්මයට අණ කළ බැවිනි. ඒ අශුද්ධාත්මය නොයෙක් වර ඔහුට ආවේශ වූ බැවින්, යදම්වලින් ද විලංගුවලින් ද බැඳ ඔහු මුර කරන ලද්දේ ය; එහෙත් ඔහු ඒ බැඳුම් කඩා දමී ය. දුෂ්ටාත්මය විසින් ඔහු පාළුකරයට පලවා හරින ලද්දේ ය. "තාගේ නම කුමක් දැ"යි ජේසුස් වහන්සේ ඔහුගෙන් ඇසූ සේක. බොහෝ දුෂ්ටාත්ම ආවේශ ව සිටි නිසා, ඔහු "සේනා"යි කී ය. එවිට දුෂ්ටාත්මයෝ පාතාලයට යන පරිදි තමන් හට අණ නොකරන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලූහ. එතැන කන්දේ මහා ඌරු රැළක් ගොදුරු කමින් සිටියෝ ය. ඌරන්ට වැහෙන පිණිස දුෂ්ටාත්මයෝ උන්වහන්සේගෙන් අවසර ඉල්ලූහ. උන්වහන්සේ අවසර දුන් සේක. දුෂ්ටාත්මයෝ ඒ මිනිසාගෙන් දුරු ව ගොස් ඌරන්ට ආවේශ වූහ; එකල ඌරු රැළ ප්‍රපාතයෙන් පහළ විලට වේගයෙන් දිව ගොස් ගිලී මළෝ ය. ඌරු ගොව්වෝ සිදුවූ දේ දැක, පලා ගොස් නුවරෙහි ද ගම්මානයෙහි ද එපවත් දැන්වූහ. ඒ සිද්ධිය බලන පිණිස මිනිස්සු පිටත් ව අවුත්, ජේසුස් වහන්සේ වෙත පැමිණ, දුෂ්ටාත්මයන් දුරු කරනු ලැබූ මිනිසා ඇඳුම් ඇඳ, හොඳ සිහි කල්පනාවෙන් ජේසුස් වහන්සේගේ පාමුල ඉඳිනු දැක, බිය වූහ. එය සියැසින් දුටු අය, දුෂ්ටාත්මාවේශ ව සිටි මිනිසා සුවය ලැබූ සැටි ඔවුන්ට කීහ.

(ලූක් 8:26-36)

මෙම ප්‍රාතිහාර්යයෙන් අපට පෙන්වන්නේ දේව පුත්‍ර ජේසුස් වහන්සේගේ බලයට යක්ෂයා පවා මෙල්ල වන බවත් උන්වහන්සේ නිතර ම යක්ෂ බලවේගවලින් මනුෂ්‍යයා බේරා ගන්නා බවත් ය. අප නිතර ම යක්ෂ බලවේගවලට අසු නොවී සිටීමට ජේසුස් වහන්සේට යාච්ඤා කළ යුතු ය. අප නිතර ම දේව ආරක්ෂාවට භාර දිය යුතු ය.

### 4. මළවුන් උත්ථාන කිරීම - ජායිරස්ගේ දුව උත්ථාන කිරීම

ධර්ම ශාලා ප්‍රධානියෙකු වූ ජායිරස් නම් කෙනෙක් අවුත් ජේසුස් වහන්සේගේ පාමුල වැටී සිය නිවසට වඩින ලෙස උන්වහන්සේගෙන් උදක් ම ඉල්ලී ය. එසේ කළේ දෙළොස් වසක් පමණ වයස් වන ඔහුගේ එක ම දියණියන් මරණාසන්න ව සිටි බැවිනි. උන්වහන්සේ වඩනා කල සමූහයා උන්වහන්සේ තෙරපමින් ගියහ. ධර්මශාලා නායකයාගේ ගෙදරින් කෙනෙක් අවුත්, "ඔබේ දුව මළා ය; ගුරුදේවයන් නොවෙහෙසන්නැ"යි කී ය. ජේසුස් වහන්සේ ඒ අසා, "බිය නොවන්න, ඇදහිල්ලෙන් ම සිටින්න, ඈ සුව වනු ඇතැ"යි උත්තර දුන් සේක. උන්වහන්සේ ගෙදරට පිවිසි කල, පේදුරු ද ජොහන් ද ජාකොබ් ද දැරියගේ පියා ද මව ද හැර අන් කිසිවෙකුට තමන් සමග ඇතුළු වන්න අවසර නුදුන් සේක. සියල්ලෝ ම ඈ ගැන හඬමින් වැලපෙමින් සිටියහ. එහෙත් උන්වහන්සේ කතා කොට, "නාඩන්න, ඈ මැරී නැත, ඈ නිදන්නී ය"යි වදාළ සේක. ඔවුහු ඈ මළ බව දැන උන්වහන්සේ උපහාසයට ලක් කළහ. එහෙත් උන්වහන්සේ ඇගේ අත අල්ලා, "දැරිය, නැඟිටින්නැ"යි ශබ්ද නගා වදාළ සේක. එවිට ඇගේ ප්‍රාණය නැවත ආයේ ය. ඈ එකෙණෙහි ම නැගිට්ටා ය. ඇයට යමක් කන්න දෙන ලෙස උන්වහන්සේ අණ කළ සේක. ඇගේ මවුපියෝ විස්මිත වූහ; එහෙත් මේ සිද්ධිය කිසිවෙකුට නොකියන ලෙස උන්වහන්සේ ඔවුන්ට අණ දුන් සේක.

(ලූක් 8:40-42, 49-56)

මරණය ජේසුස් වහන්සේට නින්දක් මෙනි. නින්දෙන් අවදි කරන්නාක් මෙන් ජේසුස් වහන්සේ විශ්වාස කරන අය ද උන්වහන්සේ උත්ථාන කරන සේක. එම විශ්වාසය ඇති ව මෙලොව යහපත් ව හා නිදොස් ව ජීවත් වීම අපගේ යුතුකම ය.

අපගේ ජීවිතවල ප්‍රාතිහාර්ය අත්දකීමට නම්;

- සියල්ල දෙවියන් වහන්සේට කළ හැකි බව විශ්වාස කළ යුතු ය.
- විශ්වාසයෙන් යාච්ඤා කළ යුතු ය.

### ක්‍රියාකාරකම

1. ජේසුස් වහන්සේ සිදු කළ ප්‍රාතිහාර්ය වර්ගවලට උදහරණය බැගින් ලියා දක්වන්න.
2. ඔබගේ ජීවිතය තුළ ප්‍රාතිහාර්යක් අත්දුටු අවස්ථාවක් ලියා දක්වන්න.
3. ලෙඩ රෝගවලින් පෙළෙන අයට ඉක්මන් සුවය පතා කිව හැකි යාච්ඤාවක් ලියන්න.



### ජීවිතයට බිඳක්

- *ජීවිත අභියෝගවල දී විශ්වාසයෙන් දෙවිඳුන් වෙත හැරෙමු.*
- *ජීවිත ප්‍රශ්න හමුවේ විශ්වාසයෙන් යුතු ව යාච්ඤා කරමු.*
- *එදිනෙද කටයුතුවල දී දේව හඬට සවන් දී ඒ අනුව ක්‍රියා කරමු.*
- *විවිධාකාර ලෙඩ රෝගවලින් පෙළෙන අය වෙනුවෙන් සුවය පතා යාච්ඤා කරමු.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.